# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1,518/15 – 2007 ඔක්තෝබර් 09 වැනි අඟහරුවාදා – 2007.10.09

(ආණ්ඩුවේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස : (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## ආණ්ඩුවේ නිවේදන

එල්.ඩී.බී. 21/78.

**1978 අංක 16 දරන විශ්ව විද්‍යාල පනත**

27 වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ වූ නියමය

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 27 වන වගන්තියේ (1) වන උපවගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, උසස් අධ්‍යාපන අමාත්‍ය මහාචාර්ය වටරැක ආරච්චිලාගේ විශ්වා වර්ණපාල වන මා විසින්, මේ නියමය මගින් විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අනුමැතිය ඇතිව, කලින් කළ සංශෝධිත රජරට විශ්වවිද්‍යාලය හා සම්බන්ධ වූ 1995 නොවැම්බර් මස 07 වන දින හා අංක 896/2 දරන රජයේ *අති විශෙෂ ගැසට්* පත්‍රයේ පළ වූ නියමය, සහ අවසන් වරට 2006 ජූලි මස 07 වන දින හා අංක 1452/24 දරන රජයේ *අති විශෙෂ ගැසට්* පත්‍රයෙන් පළ කරන ලද නියමය මගින් සංශෝධිත, ඉහත කී පනතේ 21 වන වගන්තිය යටතේ සාදන ලද නියමය එහි උපලේඛනයෙහි I වන තීරයේ "වෛද්‍ය සහ සමාන්තර විද්‍යා පීඨය " යන අයිතමය සහ එයට අනුරූපීව එම උපලේඛනයෙහි II වන තීරයේ සඳහන් වන්නා වූ සියලුම අයිතම ඉවත් කොට, ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන්, එම නියමය මෙයින් සංශෝධනය කරනු ලැබේ :-

"උපලේඛනය

| *I වන තීරය* | *II වන තීරය* |
|---|---|
| පීඨය | අධ්‍යයන අංශය |
| වෛද්‍ය සහ සමාන්තර විද්‍යා පීඨය | 1. කාය ව්‍යවච්ඡේද අධ්‍යයන අංශය |
| | 2. භෞතවේද අධ්‍යයන අංශය |
| | 3. ජීව රසායන විද්‍යා අධ්‍යයන අංශය |
| | 4. භිෂග්වේද අධ්‍යයන අංශය |
| | 5. ව්‍යාධිවේදී අධ්‍යයන අංශය |
| | 6. පරපෝෂවේද අධ්‍යයන අංශය |
| | 7. ප්‍රජා වෛද්‍ය අධ්‍යයන අංශය |

උපලේඛනය (සම්බන්ධිතයි)

| *I වන තීරය* | *II වන තීරය* |
|---|---|
| පීඨය | අධ්‍යයන අංශය |
| | 8. පවුල් වෛද්‍ය අධ්‍යයන අංශය |
| | 9. ක්ෂුද්‍ර ජීව විද්‍යා අධ්‍යයන අංශය |
| | 10. අධිකරණ වෛද්‍ය අධ්‍යයන අංශය |
| | 11. වෛද්‍ය විද්‍යා අධ්‍යයන අංශය |
| | 12. ශල්‍ය වෛද්‍ය විද්‍යා අධ්‍යයන අංශය |
| | 13. ප්‍රසව හා නාරිවේද අධ්‍යයන අංශය |
| | 14. මනෝ වෛද්‍ය විද්‍යා අධ්‍යයන අංශය |
| | 15. ළමා රෝග සහ කෞමාර භෘතිය අධ්‍යයන අංශය” |

මහාචාර්ය, වටරැක ආරච්චිලාගේ විශ්වා වර්ණපාල,
උසස් අධ්‍යාපන අමාත්‍ය.

2007 ඔක්තෝබර් මස 04 වැනි දින,
කොළඹ දී ය.

10-761